## අනගාරික ධර්මපාලතුමාගේ ''නූතනත්ව'' ව්‍යාපෘතිය පිළිබඳ සමාජ-මානව විද්‍යාත්මක සිතා බැලීමෙන් ඔබ්බට

**මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා**
සමාජ විද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
*prema112@hotmail.com*

"No major Sinhala thinker or writer affer him has escaped his influence, directly or indirectly"

ප්‍රධාන පෙළේ සිංහල බුද්ධිමතුන් මෙන්ම ලේඛකයන් ඔහුගේ බලපෑමට ඍජුව හෝ වක්‍රව හසු නොවී සිටීමට නොහැකි විය (සෙනෙවිරත්න, 1999 : 28).

බ්‍රිතාන්‍ය යටත් විජිත ශ්‍රී ලංකාව තුළ මතු වූ අග්‍රගණ්‍ය ස්වදේශික චින්තකයා, සමාජ ක්‍රියාකාරිකයා මෙන්ම සමාජ-ආර්ථික පුනර්ජීවකයා ලෙස අනගාරික ධර්මපාලතුමා අවිවාදයෙන් පිළිගත හැක. යටත් විජිත වතු වැවිලි ආර්ථිකයේ ආනුභාවය යටතේ මතු වූ නව යටත් විජිත ප්‍රභූ පංතිය හා බැඳුණු සමාජ-සංස්කෘතික ජීවිතවලට ඉඳුරාම වෙනස් ආස්ථානයක් ගත් ධර්මපාලතුමා, තම ජීවිත කාලයම බෞද්ධ දර්ශනය මත පදනම් වූ සමාජ-ආර්ථික හා සංස්කෘතික ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීම සඳහා වූ ව්‍යාපෘතියක් ගොඩනැගීම සඳහා ම කැප වූ චින්තකයෙකු ලෙස සැලකිය හැක.

මෙම ව්‍යාපෘතිය තුළ අපරදිග භෞතිකත්වය මත පදනම් වූ නූතනත්වය, ධර්මපාලතුමා විසින් ප්‍රතික්ෂේප කළේය යන අදහස පිළිගත නොහැකිවා පමණක් නොව, එතුමා අපරදිග නූතනත්වය පෙරදිග ආධ්‍යාත්මික දර්ශනය (බුදු දහම) හා මුසු වූ නව ''නූතනත්ව'' ව්‍යාපෘතියක් ගොඩනැගීම සඳහා උනන්දු වූ බව ඔහුගේ ලිපි ලේඛන හා කථා ආදිය පිළිබඳව තියුණු ශාස්ත්‍රීය විශ්ලේෂණයක නිරතවීමේදී පෙනී යයි. මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් ධර්මපාලතුමාගේ එම පුළුල් ව්‍යාපෘතිය හුදු ''බෞද්ධ පුනර්ජීවන'' හෝ ''අමද්‍යප'' යන ව්‍යාපාරවලට පමණක් ම ලඝු නොකොට වඩා පුළුල් සමාජ-ආර්ථික හා සංස්කෘතික සන්දර්භයක් මත පදනම්ව තේරුම් ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කිරීමට කැමැත්තෙමි.

ධර්මපාලතුමාගේ ශාස්ත්‍රීය, ශාසනික හා සමාජ දායකත්වය පිළිබඳ ශාස්ත්‍රීය පර්යේෂණ කෘති හා පත්‍රිකා ඇතුළත් ''ධර්මපාල ශාස්ත්‍රීය සාහිත්‍යයක්'' ගොඩනැගී ඇති නමුත්, ඔහුගේ පුළුල් ව්‍යාපෘතිය අවබෝධ කර ගැනීමෙහිලා ඒවා ඉස්මතු කිරීමට උත්සාහ දරනවා වෙනුවට ධර්මපාලතුමාගේ යම් යම් ක්‍රියාකාරකම්; එනම් අමද්‍යප ව්‍යාපාරය, ධර්මදූත ව්‍යාපාරය,

ජාතිකවාදී ව්‍යාපෘතිය වැනි ව්‍යාපෘති මතු කොට දැක්වීම කැපී පෙනේ. මෙම ව්‍යාපෘතිවලට අදාළ සමාජ-මානව විද්‍යාත්මක දැනුම් නිෂ්පාදනය ඉතා ප්‍රබල ලෙස මතු කොට ඇති සමාජ-මානව විද්‍යාඥයින් අතර ගණනාත් ඔබේසේකර (1976), කිත්සිරි මලල්ගොඩ (1976), එච්. එල්. සෙනෙවිරත්න (1999), ස්ටීවන් කෙම්පර් (2015), සරත් අමුණුගම (2016) වැදගත් වේ.

මෙම අධ්‍යයන බොහෝමයක් ම පාහේ බෞද්ධ පුනරුද ව්‍යාපාරය මෙන්ම, ඒ තුළ ධර්මපාලතුමාගේ කාර්යභාරය විශ්ලේෂණය කිරීම අරමුණු කොට ගෙන රචනා වී ඇත. එම අධ්‍යයන හරහා විශේෂයෙන්ම දීර්ඝ යටත් විජිත සමය තුළ ලාංකේය සමාජ සැකැස්මේ ඇති වූ විපර්යාසයන් මෙන්ම, ඊට සමගාමීව බුදු දහම තුළ ඇති වූ පරිවර්තනයන් කෙරෙහි අවධානය යොමු කරන ලදි. නව ප්‍රභූ සමාජ පන්තීන්ට සාපේක්ෂව නාගරික ප්‍රදේශ කේන්ද්‍ර කොට ගෙන මතු වූ නව බුදු දහම (Neo-Buddhism) නැතිනම්, ''ප්‍රොතෙස්තන්ත්‍ර බුදු දහම'' (බලන්නඃ ද සිල්වා, 2008) ලෙස ඔවුන් විසින් සූත්‍රගත කරන ලද නව ගති ලක්ෂණවලින් හෙබි ''නාගරික බුදු දහම'' වඩා ප්‍රබල ලෙස මතු කරනු ලැබුවේ අනගාරික ධර්මපාලතුමා විසින් යැයි පැහැදිලි කෙරේ. නමුත් මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් පෙන්වා දීමට උත්සාහ දරන්නේ ධර්මපාලතුමාගේ භූමිකාව එවැනි සූත්‍රගත කිරීම්වලින් ඔබ්බට ගොස් පුළුල් සමාජ-ආර්ථික හා සංස්කෘතික සන්දර්භයක් තුළ, ඔහුගේ ''නූතනත්ව ව්‍යාපෘතිය'' අවබෝධ කර ගැනීමේලා පුළුල් සාකච්ඡාවකට අවශ්‍ය ඉදිරි දැක්මක් සකසා ගැනීම පිළිබඳව යළි සිතා බැලීමක් අරභයා බව සඳහන් කිරීමට කැමැත්තෙමි. ඒ සඳහා ධර්මපාලතුමා පිළිබඳ රචනා වී ඇති සමාජ-මානව විද්‍යාත්මක සාහිත්‍යය මෙන්ම, වෙනත් ශාස්ත්‍රඥයන් විසින් රචනා කරන ලද ලිපි ලේඛන ආදිය (උදා :- ගුරුගේ, 1965, 1991) යොදා ගැනීමට බලාපොරොත්තු වෙමි. ධර්මපාලතුමා හුදු ජාතිවාදියකු, ආගම්වාදියකු ලෙස තේරුම් ගැනීමේ ගැටලුව මෙහි දී ප්‍රශ්න කරනු ලබන අතර, ඔහු නූතනවාදී ශ්‍රී ලංකාවක් ගොඩනැගීම සඳහා මතු කරන ලද මතවාදය ගැඹුරින් විමසා බැලීමෙන් ඒ හරහා ඔහු ජාතිවාදියකු හෝ ආගම්වාදියකු නොව නූතනවාදියකු ලෙස පිළිගත යුතු යැයි තර්ක කෙරේ.